**දුරකථන/தொலைபேசி இல./Telephone Nos.**

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................................

**අධ්‍යාපන අමාත්‍යාංශය**
**கல்வி அமைச்சு**
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

"இசுருபாயா"
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No.: රබ්/1/1/2/D/Circular(2011)

දිනය / திகதி / Date: 2011/03/29

**චක්‍රලේඛ අංකය 2011/15**

**සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**
**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**නැටුම් විෂය භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**
**නැටුම් ගුරු උපදේශකවරුන් සහ**
**විදුහල්පතිවරුන් වෙත,**

# නර්තන විෂයෙහි ගුණාත්මක සංවර්ධනය
# <u>හිස වෙස් තැබීම, ශීර්ෂාභරණ පැළඳවීම හා සංදර්ශන පැවැත්වීම.</u>

**අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය (සෞන්දර්ය - නර්තන) මගින් නිකුත් කරන මෙම චක්‍රලේඛය ඔබ පළාතේ / කලාපයේ සියලුම පාසල්වල විදුහල්පතිවරුන්, අදාළ ගුරු භවතුන් හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුමත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.**

## හැඳින්වීම.

දිවයිනේ පාසල්වල නර්තන විෂයට අදාළව හිස වෙස් තැබීම හා ශීර්ෂාභරණ පැළඳවීමේ උත්සව බොහෝ පවත්වනු ලැබේ. මෙය ප්‍රමාණාත්මකව සංවර්ධනයක් වුව ද, ගුණාත්මකව සංවර්ධනය වූවක් නොවන බව පෙනේ. ආධුනික ශිල්පියෙකු තම ශිල්පීය කුසලතා හෙළි දැක්වීම සඳහා පවත්වන මෙම උත්සව වර්තමානයේ බොහෝ පාසල්වල සිදු කර ඇත. එහි ගුණාත්මක බව නොමැතිකමින් අදාළ උත්සවය පිළිබඳ පැමිණිලි බොහොමයක් ලැබී ඇත. පාසලේ ගුරු භවතුන් විසින් මෙකී උත්සවය සඳහා සිසුන් සූදානම් කර අවසානයේ දෙමව්පියන් සහ සිසුන්ගේ වියදමින් අදාළ කටයුතු කර ගෙන යාමේ දී අකටයුතු බොහොමයක් සිදුවන අතර නර්තන විෂයේ ගුණාත්මක සංවර්ධනයට, ප්‍රගමනයට බාධාවක් මෙන් ම අපකීර්තියට පත්වීමට ද හේතු සාධකයක් වී ඇත. තවද, ඇතැම් ගුරු භවතුන් නර්තන විෂය නිර්දේශය පාසලේ දී ආවරණය නොකර මුදල් අයකරමින් තම පෞද්ගලික පන්ති වලින් විෂය ආවරණය කරන බවට ද තොරතුරු ලැබී ඇත. මෙය ද, නර්තන විෂයේ ගුණාත්මක සංවර්ධනයට හානියකි.

## අරමුණු

- සුසමාහිත පෞරුෂ වර්ධනය සඳහා විඥාන වර්ධනය, රසඥතා වර්ධනය, ආකල්ප වර්ධනය හා ශක්‍යතා වර්ධනය කිරීම.
- නර්තන විෂය ආචාර ධර්ම ආරක්ෂා කිරීම.
- උඩරට සාම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය කිරීම.
- නර්තන විෂයේ ගුණාත්මක සංවර්ධනය
- හිස වෙස් බැඳීම සහ ශීර්ෂාභරණ පැළඳවීම සිසුන්ගේ කැමැත්ත අනුව පමණක් සිදු කිරීම.
- දෙමව්පියන් සහ සිසුන් අසීරුවට පත් නොකිරීම.
- දෙමව්පියන්, සිසු දරුවන් මූල්‍යමය අපහසුතාවලට ලක් වීම වැළැක්වීම.

## පොදු නීති රීති හා කොන්දේසි

- වයස අවුරුදු 15ට අඩු පිරිමි දරුවන්ට හිස වෙස් බැඳීම නොකළ යුතු ය.
- වයස අවුරුදු 15ට අඩු ගැහැණු දරුවන්ට ශීර්ෂාභරණ පැළඳවීම නොකළ යුතු ය.
- එකී උත්සවය සඳහා සකස් කරන ලද ව්‍යාපෘතිය ජාතික පාසලක් නම් ඔබ කලාපයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයා/ගුරු උපදේශක ගේ නිර්දේශ මත අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. පළාත් පාසලක් නම් ඔබ කලාපයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයා/ගුරු උපදේශක ගේ නිර්දේශ මත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් සෞන්දර්ය/නර්තන විෂය අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබා ගත යුතු ය. එහි පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අංශයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයාට ද එවීමට කටයුතු කරන ලෙස දන්වා සිටිමි. උත්සවය සඳහා සිසුන්ගෙන් මුදල් අය නොකළ යුතුය.
- විදුහල්පති සහතික කළ වැය ඇස්තමේන්තුවක් කලාපයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගත යුතුය.
- සම්පූර්ණ උත්සවයේ වාර්තාවක්, අයවැය වාර්තාවක් විදුහල්පතිගේ නිර්දේශය මත ජාතික පාසලක් නම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයාට ද, පළාත් පාසලක් නම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ද, යොමු කළ යුතුය. එහි පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන විෂය භාර අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතු ය.
- උත්සව පෙරදින හා උත්සව කටයුතු අවසන් වීමෙන් පසු සහභාගී වන සියලු දෙනාම සාරධර්ම වලට පටහැනි වන සේ කටයුතු සිදු කිරීමෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටිය යුතුය.
- ගැහැණු දරුවන්ට පාහින්පත් පැළඳවීමේ දී ස්නානය වැනි කටයුතු බෞද්ධාගමික ස්ථාන තුල දී නොකළ යුතු ය.
- පාසල් සිසු සිසුවියන් හිස වෙස් තැබීම හා ශීර්ෂාභරණ පැළඳවීම තම පාසලේ නර්තන ගුරු භවතාගේ මූලිකත්වය යටතේ සිදු කිරීම අනිවාර්ය වේ.

## නර්තන සංදර්ශන

- දේශීය හර පද්ධතීන් ආරක්ෂා වන පරදි ඇඳුම් සකස් කළ යුතු අතර සිසු සිසුවියන්ගේ ආත්ම ගෞරවය සුරකෙන පරිදි හා සංවරශීලී ලෙස අඟ පසඟ නිරාවරණය නොවන ලෙස නිර්මාණය වී තිබිය යුතුය.
- මාධ්‍යයට නර්තන ප්‍රසංග අංග ඉදිරිපත් කිරීමේදී ද ඉහත වගන්තිය එලෙසම අදාළ වේ.
- ඒ ඒ පාසලේ ගෞරවයට හානියක් වන පරිදි අදහස් ප්‍රකාශ නොකළ යුතුය.
- පාසලෙන් පරිබාහිරව සම්පත් දායකයින් යොදා ගැනීම, ගෙන්වා ගැනීම සහ පුහුණු කිරීම පාසලේ ඉගෙනුම් ක්‍රියාවලියට හානි වන පරිදි පාසල් කාල වේලාව තුල සිදු කිරීම නොකළ යුතුය.
- කිසිදු අවස්ථාවක පාසලේ ඉගෙන ගන්නා සිසුන්ගෙන් මුදල් අය නොකළ යුතු අතර පාසල තුල නර්තන ගුරු භවතා විසින් පෞද්ගලික පන්ති නොපැවැත්වීමට තරයේ වග බලා ගත යුතුය.
- පාසලේ දී නර්තන විෂය ගුණාත්මකව ඉගැන්වීම සඳහා කාල පරිච්ඡේද වෙන් කර ඇත. විෂය නිර්දේශය පාසලේ දීම ආවරණය කළ යුතු අතර පෞද්ගලික පන්තියට සිසුන්ට ආරාධනා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. ඒ පිළිබඳ පැමිණිලි ලැබුනු විට විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

## හිස වෙස් තැබීම හා ශීර්ෂාභරණ පැළඳවීමේ දී සිසු සිසුවියන්ට ප්‍රගුණ කළ යුතු අවම විෂය සංධාරය.

- මංගලම්, හත් පදය, යක් ඇන්නුම, මඩු පුරය සහ මල් හත් පදය, අස්නෙ, ආවැන්දුම, කෝල්මුර දෙකක්, දාන එකක්, කතා එකක්, යක්කම් එකක්, හගල යැදීම, මල් යහන්, මාරා පදය සමග අදාළ ගායනා පිළිබඳව කුසලතාවය තිබිය යුතුය.

**එච්.එම්. ගුණසේකර**

**ලේකම්,**

**අධ්‍යාපන අමාත්‍යාංශය.**